## මාධ්‍ය නිවේදනය.

## සුබසාධක සහනාධාර ප්‍රතිලාභ ගෙවීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනා ගැනීම 2022

## நலன்புரி நன்மைகள் செலுத்துதல் தொடர்பில் தகுதியான நபர்களை கண்டறிதல் 2022

## Identification of Persons Eligibility to Receive Welfare Benefits Payments 2022

2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ 7(1) වගන්තිය අනුව සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනාගැනීමට රජය තීරණය කර තිබේ. ඒ අනුව දැනට මහජනාධාර වැඩසටහන් වන සමෘද්ධි, වැඩිහිටි පුද්ගල, අබාධිත පුද්ගල සහ වකුගඩුරෝගී ජීවනාධාර වැඩසටහන් යටතේ ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සහ එම සහනාධාරය අපේක්ෂාවෙන් පොරොත්තු ලේඛණ වල සිටින පවුල් සහ පුද්ගලයින්ද වත්මන් ආර්ථික අර්බුදයේ බලපෑමට ලක්ව, රජයේ සුබසාධක ප්‍රතිලාභ අපේක්ෂා කරන සියළු පිරිස් ද වැඩසටහන සඳහා ඉලක්ක කොට ගෙන ඇත. ඒ අනුව පවුල් මිලියන 3.9ක් මෙම වැඩසටහන සඳහා අයදුම් කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. වැඩසටහන පියවර කිහිපයක් යටතේ ක්‍රියාත්මක වේ.

**පළමු පියවර - වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවීම.**

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය 2022/08/30 දින ජාතික පුවත්පත් දෙකක සිංහල සහ දමිළ භාෂාවෙන් පලකළ පුවත්පත් දැන්වීමේ ඇමුණුම 1 සඳහන් ආදර්ශ ආකෘතියට අනුව සකස් කළ අයදුම්පතක් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර තමා අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාර දිය යුතුය. අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, දුරකථන අංකය, ජාතික හැඳුනුම්පත් අංකය හෝ වෙනත් හැඳුනුම්පත් අංකය, පළාත, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ග්‍රාම නිලධාරි කොට්ඨාශය, දැනට ප්‍රතිලාභ ලබන සුබසාධක වැඩසටහන් පිළිබඳ තොරතුරු, පවුලේ සිටින මුළු සංඛ්‍යාව, පොරොත්තු ලේඛණයේ සිටී නම් ඒ පිළිබඳ තොරතුරු, නව අයදුම්කරුවෙක්ද යන්න පිළිබඳ තොරතුරු ඇතුළත් අයදුම්පතක් අයදුම්කරු විසින් අදාළ ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම/ සමෘද්ධි සංවර්ධන නිලධාරී හෝ සමාජ සේවා නිලධාරී හෝ වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී ගේ සහතික කිරීමක් ද සහිතව අදාල නිලධාරියා හරහා හෝ අයදුම්කරු විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාරදිය යුතු වේ.

**දෙවන පියවර - අයදුම්පත් පද්ධතිගත කිරීම.**

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සංවර්ධනය කර ඇති සුබසාධක ප්‍රතිලාභ තොරතුරු පද්ධතිය (Welfare Benefit Information System) සමඟ කටයුතු කිරීමට සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අනුයුක්ත කර ඇති සුබසාධක ප්‍රතිලාභ තොරතුරු නිලධාරීන් විසින් ලැබී ඇති අයදුම්පත් පද්ධතිය මඟින් ලබා දී ඇති යොමුව (Link) හරහා පරිගණක ගත කළ යුතුය. සියලු ඉල්ලුම්පත් සඳහා QR කේතයක් වෙන් කරනු ලැබේ. පද්ධතියේ සහ වැඩසටහනේ ඉදිරි කටයුතු වඩාත් කාර්යක්ෂමව සහ විනිවිදභාවයෙන් යුතුව සිදු කිරීම එහි අරමුණයි.මෙම පියවර සැප්තැම්බර් 15 දින සිට ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

**තුන්වන පියවර - ගෘහ ඒකක වෙත ගොස් දත්ත එක්රැස් කිරීම.**

ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් දත්ත එක් රැස්කිරීම සඳහා අනුයුක්ත කර ඇති ක්ෂේත්‍ර නිලධාරීන් (තේරීම් කමිටු) තම පෞද්ගලික ජංගම දුරකථනය (3G Smart Phone) භාවිතා කරමින් අයදුම්කරුවන්ගේ ගෘහ ඒකක වෙත ගොස් ජංගම දුරකථන යෙදවුමක් (Mobile App) භාවිතා කරමින් දත්ත එක්රැස් කර පද්ධතිගත කිරීම තුන්වන පියවරයි. සියලු දත්ත එක්රැස් කරන නිලධාරීන් සුබසාධක ප්‍රතිලාභ පනතේ අංක 21 සහ 22 වගන්ති(රාජ්‍ය නිලධාරියන් විසින් කරණු ලබන වැරදි සහ වැරදි ගෙවීම් වලදී ආපසු අයකර ගැනීම) අනුව කටයුතු කිරීමට එකඟ විය යුතුය. දත්ත එක්රැස් කිරීම අවසන් වූ පසු ක්ෂේත්‍ර නිලධාරීන් විසින් අයදුම්කරුට දත්ත ලබා ගැනීම සහතික කරන QR කේතය ඇතුළත් පත්‍රිකාවක් තම අත්සන යොදා ලබා දිය යුතු වේ. අයදුම්කරු විසින් නිවැරදිව දත්ත ලබා දුන් බවට QR කේතය ඇතුළත් පත්‍රිකාවට අත්සන තබා සහතික කළ යුතුය. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් පලකල 2019.06.20 දිනැති අංක 2128/24 දරණ ගැසට් පත්‍රයේ සඳහන් තෝරා ගැනීම සඳහා වන නිර්ණායක සහ දර්ශකවලට අදාලව ජංගම දුරකථන යෙදවුම් මෘදුකාංගයක් මඟින් අයදුම්කරු සහ පවුල පිළිබඳ සවිස්තරාත්මකව තොරතුරු එක්රැස් කරනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙලෙස දත්ත එක්රැස් කරන ලද අයදුම්කරුවන්ගේ නාම ලේඛනයට ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය හිමි වූ පසු එම නාම ලේඛනය පද්ධතිගත වේ.ගෘහ ඒකක මට්ටමින් දත්ත එක්රැස් කිරීමේ මෙම පියවර සැප්තැම්බර් 30 වන දින සිට දීපව්‍යාප්තව ආරම්භ කිරීමට නියමිතය.

**හතරවන පියවර - තෝරා ගැනීමේ නිර්ණායක සහ දර්ශක අනුව ලකුණු ලබා දීම.**

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් පලකළ 2019.06.20 දිනැති අංක 2128/24 දරණ ගැසට් පත්‍රයේ සඳහන් ප්‍රධාන නිර්ණායක 6 ක් (අධ්‍යාපනය/ සෞඛ්‍ය/ ආර්ථික මට්ටම/ වත්කම්/ නිවාස තත්වය/ පවුලේ ජන විකාශනය) සහ ඊට අදාළ දර්ශක 22ක් යටතේ දරිද්‍රතාවය ගණනය කිරීම සූත්‍රගත ක්‍රමයකට සකස් කර ඇත. සුබසාධක ප්‍රතිලාභ තොරතුරු පද්ධතිය දරිද්‍රතාවය ගණනය කිරීමේ සූත්‍රයට අනුව සෑම අයදුම්කරුවෙකුටම ලකුණු ලබා දීම සිදු වේ. එම දරිද්‍රතා ලකුණු මත සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා සුදුසුකම් ලැබූ තැනැත්තන්ගේ නාම ලේඛනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රදර්ශනය කරනු ලැබේ. දෙසැම්බර් 15 වන දින වන විට මෙම අදියර අවසාන කිරීමට මණ්ඩලය බලාපොරොත්තු වේ.

**පස්වන පියවර - අභියාචන/ විරෝධතා කැඳවීම.**

සුබසාධක ප්‍රතිලාභ පනතේ අංක 11(1) වගන්තිය යටතේ විරෝධතා සහ අභියාචනා කැඳවීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයක් මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. යම් පුද්ගලයෙකුට හෝ අයදුම්කරුවෙකුට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති නම් ලැයිස්තුවල සඳහන් නම් වලට විරෝධතා පෑමක් හෝ හිමිකම් පෑමක් ඉදිරිපත් කළ හැක. පැමිණිලිකරු/අභියාචනාකරු විසින් විරෝධතා සහ හිමිකම්පෑමට අදාළ ඉල්ලුම්පත සම්පූර්ණ කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල  වෙත ලබා දිය යුතු වේ. එලෙස ලැබෙන විරෝධතා හෝ හිමිකම්පෑම පිළිබඳ ඉල්ලීම් පරීක්ෂණය සහ විමර්ශනය කිරීමට සුබසාධක ප්‍රතිලාභ පනතේ අංක 12(1) වගන්තිය අනුව මණ්ඩලය විසින් අභියාචන කමිටු පත්කළ යුතුය. අභියාචන කමිටු විසින් අදාළ විරෝධතා/ හිමිකම්පෑම සම්බන්ධ ඉල්ලීම් පිළිබඳ විමර්ශන කොට තීරණය ප්‍රාදේශීය ලේකම්වරයාට සහ මණ්ඩලයට දැනුම් දිය යුතුය. අභියාචනා කමිටු, මණ්ඩලය විසින් ප්‍රකාශිත විධි විධාන සහ මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීම අනිවාර්යය වේ.

**හය වන පියවර - ප්‍රතිලාභී නාම ලේඛනය ප්‍රසිද්ධ කිරීම.**

ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සුබසාධක ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලැබූ අවසන් ප්‍රතිලාභී නම් ලැයිස්තුව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. මණ්ඩලයේ අනුමැතියෙන් පසු සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා තෝරාගත් ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය ප්‍රසිද්ධයට පත් කරනු ලබයි.

සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනාගැනීමේ වැඩසටහන 2022 සාර්ථක කර ගැනීමට සහ එය ජනගත කිරීමට සියලු ජනමාධ්‍ය ආයතනයන්හි සහයෝගය අපේක්ෂා කරමි. රාජ්‍ය සුබසාධක සංකල්පය වඩාත් ඵලදායී, කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුතුව වැඩිදියුණු කිරීමේ ආභිමතාර්ථය සාර්ථක කරගැනීමට සියලු ජනමාධ්‍ය ආයතනයන්හි දායකත්වය නිරතුරුවම අපේක්ෂා කරමි.

බී. විජයරත්න
සභාපති/ කොමසාරිස්
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

දුරකථන අංකය :- 0112484600 Ext 4117

ෆැක්ස් අංකය :- 0112151482

e mail :- info@iwms.wbb.gov.lk

welfarebenefitboard2016@gmail.com

| | |
|---|---|
| පාර්ශව ආයතන - | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය |
| | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව |
| | වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය |
| | ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය |
| | ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ නියෝජිතායතනය |